# SMALL
# &
# MEDIUM SCALE BUSINESSES
# (Part-II)


***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති පියවර

- මූල්‍යමය දිරිගැන්වීම්
- මූල්‍යමය නො වන දිරිගැන්වීම්

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති මූල්‍යමය දිරි ගැන්වීම්

- කෙටිකාලීන හා දිගුකාලීන ණය
- මූල්‍යමය ආධාර
- බදු සහන
- ප්‍රතිමූල්‍ය පහසුකම්

ClassWork.LK

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති මූල්‍යමය නොවන දිරි ගැන්වීම්

- උපදේශන සේවා
- ව්‍යවසායක සංවර්ධන වැඩ සටහන්
- පර්යේෂණ හා තාක්ෂණික සේවා
- යටිතල පහසුකම් සැපයීම
- වෙළෙඳපොළ පහසුකම් ලබා දීම/අලෙවි පහසුකම්
- විශිෂ්ටතා හා සම්මාන ලබා දීම

ClassWork.LK

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන

- රාජ්‍ය ආයතන
- වෙනත් ආයතන

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන රාජ්‍ය ආයතන

- කාර්මික සංවර්ධන මණ්ඩලය
- අපනයන සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- ජාතික සංවර්ධන බැංකුව
- කාර්මික තාක්ෂණ ආයතනය

ClassWork.LK

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන වෙනත් ආයතන හා සංවිධාන

- සර්වෝදය
- ජයිකා (ජපන් අන්තර්ජාතික සහයෝගිතා සංවිධානය)
- බදු වාර්තා සකස් කර දෙන පෞද්ගලික ආයතන
- සණස (සකසුරුවම් හා ණය දෙන සමිති)
- පෞද්ගලික බැංකු සහ මූල්‍ය ආයතන

ClassWork.LK

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන හා ඒවායින් ලබා දෙන දිරිගැන්වීම්

| ආයතනය | ආයතනය ලබා දෙන දිරි ගැන්වීම් |
|---|---|
| • ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) | • මූල්‍යමය පහසුකම් ලබා දීම<br>• ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම |
| • කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව මණ්ඩලය | • විදේශ වෙළෙඳපොළ පහසුකම් සපයා දීම |
| • කාර්මික සංවර්ධන මණ්ඩලය | • උපදේශන සේවා<br>• තාක්ෂණික දැනුම ලබා දීම<br>• යටිතල පහසුකම් |
| • අපනයන සංවර්ධන මණ්ඩලය | • අලෙවි පහසුකම්<br>• උපදේශන සේවා |
| • ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | • උපදේශන සේවා |
| • ජාතික සංවර්ධන බැංකුව | • මූල්‍ය පහසුකම් ලබා දීම |
| • කාර්මික තාක්ෂණ ආයතනය | • තාක්ෂණික දැනුම ලබා දීම<br>• උපදේශන සේවා සැපයීම |
| • ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය (SLCSMI) | • මූල්‍ය පහසුකම්<br>• විශිෂ්ටතා සම්මාන ලබා දීම |

Class Work.LK

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට දිරිගැන්වීම් ලබා දෙන වර්තමානයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

## කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (ලිය ඉසුර)

කාරක ප්‍රාග්ධන සහාය සැපයිම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු හරහා සුරැකුම් අවශ්‍ය නො වන කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත.

## සුවන

අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුවේ (JBIC) මූල්‍ය අනුග්‍රාහකත්වයෙන්, ජාතික සංවර්ධන බැංකුව ප්‍රතිමූල්‍ය පහසුකම් සපයමින් සුළු කර්මාන්ත ව්‍යවසායකයින් නංවාලීම සඳහා ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමයකි.

මෙය SMILE (Small & Micro Industries Leader & Entrepreneur promotion project) ලෙස ද හඳුන්වයි. වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ මෙහි III වන අදියර ය.

ClassWork.LK

## සහන්යා

සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට ණය සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමයකි. මේ සඳහා DFCC බැංකුව හා අනෙකුත් වාණිජ බැංකු සම්බන්ධ වී ඇත.

## සණස ණය ව්‍යාපෘතිය

කෘෂි, සත්ව, කුඩා කර්මාන්ත, වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සපයන යෝජනා ක්‍රමයකි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදවා ගන්නා අතර සණස මහා සංවර්ධන සංගමය පරිපාලන කටයුතු සිදු කරයි.

## සමුපකාර ග්‍රාමීය බැංකු ණය

කෘෂි, ධීවර, සත්ව පාලනය, වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සැපයීම මෙ මගින් සිදු කරයි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනේ. මේ සඳහා විවිධ සේවා සමුපකාර සමිති හා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පරිපාලන දායකත්වය ලබා දෙයි.

ClassWork.LK

# සමෘද්ධි/දිවිනැගුම සංවර්ධන ණය යෝජනා ක්‍රමය

සමෘද්ධිය/දිවිනැගුම බැංකු සංගම් හරහා සමෘද්ධිලාභීන් වෙත ණය දීම හා අනෙකුත් සේවා සැපයීම සිදු කිරීම සඳහා මෙම යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. මේ සඳහා අවශ්‍ය මුදල් රජයේ ප්‍රධානයන්ගෙන් හා සාමාජිකයින්ගේ තැන්පතු මගින් රැස් කළ ඉතුරුම් මුදල් තුළින් ලබා ගනියි.

මෙහි පාලනය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. (සමෘද්ධි/දිවිනැගුම බැංකු ප්‍රාදේශීය සංවර්ධන බැංකු සමග ඒකාබද්ධ කරනු ලබන බව රජය නිවේදනය කර ඇත)

## ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය

(කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යංශය යටතේ ඇති ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතියකි. වගා කටයුතු සඳහා ගොවීන්ට කෙටි කාලීන ණය හා දිගුකාලීන ණය ලබා දෙයි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ගොවීන්ගේ භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura